| 42 | FO | IM | 03 |
|---|---|---|---|

අහෝසි කළ නොහැකි ලේඛනමය ණයවරයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය ☐ ණයවර ලිපි කෙටුම්පතක් අවශ්‍යය දිනය :

<table>
<tr><td colspan="3" rowspan="2">නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය<br>සමාගම් ලියාපදිංචි අංකය: පී.කිව්. 27<br>වෙළඳ මූල්‍ය දෙපාර්තමේන්තුව,<br>103 ඒ, ධර්මපාල මාවත,<br>කොළඹ 07<br>--ශාඛාව මගින් ස්විෆ්ට් ක්‍රමය හරහා නිකුත් කරන ලදී</td><td>ණයවරය අවසන් වීම</td><td>දිනය:<br><br>ස්ථානය:</td></tr>
<tr><td>අවසන් වරට නැව්ගත කළ හැකි/ යැවිය හැකි දිනය</td><td>දිනය:</td></tr>
<tr><td colspan="3">ඉල්ලුම්කරු</td><td colspan="2">අර්ථලාභියා</td></tr>
<tr><td colspan="3">ව්‍යවහාර මුදල් වර්ගය සහ වටිනාකම</td><td colspan="2" rowspan="2">(නම, ලිපිනය සහ ස්විෆ්ට් කේතය)<br>මෙම බැංකුව හරහා දැනුම් දෙන්න</td></tr>
<tr><td>ගෙවීම් කොන්දේසි</td><td colspan="2">☐ දුටුවන ☐ වෙනත් ගෙවීම් කොන්දේසි (කරුණාකර පහතින් සඳහන් කරන්න)</td></tr>
<tr><td colspan="2" rowspan="3">අර්ධ වශයෙන් නැව්ගත කිරීම්/ භාරදීම්<br>☐ අවසර ඇත<br>☐ අවසර නොමැත</td><td rowspan="3">ප්‍රති නැව්ගත කිරීම්<br>☐ අවසර ඇත<br>☐ අවසර නොමැත</td><td colspan="2">භාරදීමේ කොන්දේසි:</td></tr>
<tr><td colspan="2">ලබා දී ඇති සහනය: ........... % (ප්‍රමාණය/වටිනාකම)</td></tr>
<tr><td colspan="2">ශ්‍රී ලංකාවේ කොළඹ නගරයට ප්‍රවාහනය කිරීම පිණිස ........... වෙතින්/ හිදී නැව්ගත කරන ලදී/ යවන ලදී</td></tr>
</table>

අර්ථලාභියා විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන:

☑ ඉහත සඳහන් ගෙවීම් කොන්දේසි යටතේ ඔබ/ ඔබගේ නියෝජිතයා (තහවුරු කර ඇත්නම්) වෙත ලියා ඇති අණකර

☑ CFR/ CIF/ CIP/ CPT ප්‍රභේදනය, ආනයන බලපත්‍ර අංකය ........, වැට්බදු ලියාපදිංචි අංකය ........ දක්වමින් සහ නැව්ගත කිරීම .......... දින අංක .......... දරන ලේඛනයට අනුකූල බවට සහතික කරමින් ඉංග්‍රීසි භාෂාවෙන් අතින් අත්සන් කරන ලද වාණිජ ඉන්වොයිස්පත්‍රවල මුල් පිටපත් ........ක් සහ පිටපත් ........ ක්.

☐ ණයවර ලිපි අංකය දක්වමින්, ඉල්ලුම්කරුට දැනුම් දෙනු ලබන (නමට සහ ලිපිනයට) නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අණට අනුප්‍රේෂණය කරන ලද සම්පූර්ණ පැහැදිලි නෞකාස්ථ සමුද්‍රීය නෞභාර පත්‍ර කට්ටල ........ ක් සහ එහි පිටපත් .......... ක්.

☐ ණයවර ලිපි අංකය දක්වමින්, ඉල්ලුම්කරුට දැනුම්දෙනු ලබන (නමට සහ ලිපිනයට) නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අණට අනුප්‍රේෂණය කරන ලද පැහැදිලි ගුවන් බිල්පත සහ එහි පිටපත් ......... ක්.

☐ ණයවර ලිපි අංකය දැක්වෙන, අර්ථලාභියාගේ ගබඩාවේ සිට ඉල්ලුම්කරුගේ ගබඩාවට මනා තත්ත්වයෙන් භාණ්ඩ ලැබුණු බව තහවුරු කරන, භාණ්ඩ ලැබීමේ සටහන සහ එහි පිටපත් ........ක්.

☐ ආයතනික නැව් භාණ්ඩ පිළිබඳ වගන්තිය (A), ආයතනික යුද්ධ පිළිබඳ වගන්තිය (නැව් භාණ්ඩ), ආයතනික වැඩ වර්ජන පිළිබඳ වගන්තිය (නැව් භාණ්ඩ) ආවරණය කරමින් ඉන්වොයිස් පත්‍රයේ වටිනාකමට සහ ණයවරයට අදාළ ව්‍යවහාර මුදල්වලින් සියයට ....... කට අනියමිත ලෙස පිටසන් කළ රක්ෂණ ඔප්පුව/ සහතිකය.

☐ ........... විසින් නිකුත් කරන ලද අංක ......... දරන රක්ෂණාවරණය යටතේ අප විසින් රක්ෂණය ආවරණය කරනු ලබන අතර, අප විසින් නැව්ගත කිරීම සම්බන්ධයෙන් ඉහත සඳහන් රක්ෂණ සමාගම වෙත දන්වා ඇතිබව තහවුරු කරනු ලැබේ. රක්ෂණ ඔප්පුවේ/ සහතිකයේ පිටපතක් මේ සමග අමුණා ඇත.

☐ .......... විසින් නිකුත් කරන ලද ......... ප්‍රභව සහතිකය.

☐ ණයවරය යටතේ ඉල්ලා ඇති සියලුම ලේඛනවල පිටපත් නැව්ගත කළ/ යැවූ දින සිට දින ........ක් ඇතුළත ඉල්ලුම්කරු වෙත යවා ඇති බවට ප්‍රකාශ කරමින් අර්ථලාභියා විසින් ලබා දෙන ලද සහතිකය.

☐ ඇසුරුම් ලැයිස්තුවේ මුල් පිටපත් ........ ක් සහ එහි පිටපත් ............ ක්.

වෙනත් ලේඛන/ නියමයන් (ඇමුණුමේ නිශ්චිතව දක්වා ඇති පරිදි)

☐ .................................................................................................................................................

☐ .................................................................................................................................................

| | |
|---|---|
| භාණ්ඩ/ සේවාව (අනවශ්‍ය විස්තරවලින් තොර කෙටි විස්තරයක්)/ අවශ්‍ය නම් එය ඇමුණුමෙහි නිශ්චිතව දක්වන්න. | HS කේත අංකය/ අංක |

නැව් ලේඛනය/ ලේඛන නිකුත් කිරීමෙන් පසු දින .......... ක් ඇතුළත (කිසිවක් සම්පූර්ණ කර නොමැති නම් දින 21 ක් ඇතුළත) ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

පසුපිටෙහි දක්වා ඇති නියම සහ කොන්දේසිවලට මා/ අප විසින් එකඟ වනු ලබන අතර, ලේඛනමය ණයවර සම්බන්ධයෙන් වන ඒකීය සිරිත් සහ පිළිවෙත් 2007 ප්‍රතිශෝධනය, ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය, පැරිස් නගරය, ප්‍රංශය, ප්‍රකාශන අංක. 600 ට යටත්ව ඉහත විස්තර කර ඇති පරිදි ඔබගේ අහෝසි කළ නොහැකි ලේඛනමය ණයවරය නිකුත් කරන ලෙස ඔබෙන් ඉල්ලා සිටිනු ලැබේ.

ඔබගේ මුදල් ආන්තිකය සහ මෙම ණයවරයට අදාළ වෙනත් සියලු ගාස්තු අංක ............... දරන මගේ/අපගේ ගිණුමෙන් හර කිරීමට මා/ අප විසින් ඔබට අවසර දෙනු ලැබේ. බිල්පත් පියවීම සඳා අංක ................ දරන ගිණුම හර කිරීමට (පෙර ගිණුමට වෙනස් නම් පමණක්) ඔබට අවසර ඇත.

☐ මෙම ආනයන ගනුදෙනුව පියවීම සඳහා භාවිත කරන ලද විදේශ ව්‍යවහාර මුදල් අදාළ භාණ්ඩ අපනයනයට අදාළ බව අප විසින් තහවුරු කරනු ලැබේ.

☐ මෙම ආනයන ගනුදෙනුව පියවීම සඳහා භාවිත කරන ලද විදේශ ව්‍යවහාර මුදල් භාණ්ඩ අපනයනයට අදාළ නොවන බව අප විසින් තහවුරු කරනු ලැබේ.

| | |
|---|---|
| ☐ සියලුම ගාස්තු අපගේ ගිණුමෙන් අය කරන්න<br>☐ සියලුම ගාස්තු අර්ථලාභියාගේ ගිණුමෙන් අයකරන්න<br>☐ නිකුත් කරන බැංකුවෙන් පිටත අය කරන සියලුම ගාස්තු අර්ථලාභියාගේ ගිණුමෙන් අය කරනු ලැබේ | මීට විශ්වාසී,<br><br>.......................................<br>(අත්සන/ අත්සන් සහ සමාගමේ මුද්‍රාව) |
| ☐ තහවුරු කරන ලදී ☐ ඔබගේ නියෝජිතයා විසින් තහවුරු කර නොමැත ☐ තහවුරු කිරීම එකතු කල හැකිය ☐ තහවුරු කිරීමේ ගාස්තු ☐ අපගේ ගිණුමට ☐ අර්ථලාභියාගේ ගිණුමට | |

කළමනාකරු,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය,
ලේඛනමය ණයවර දෙපාර්තමේන්තුව,
අංක. 40, නවම් මාවත,
කොළඹ 02.

මගේ/ අපගේ ඉල්ලීම මත අනෙක් පස සඳහන් කරුණු ප්‍රකාරව ඔබ විසින් අහෝසි කළ නොහැකි ලේඛනමය ණයවරයක් විවෘත කිරීම හෝ ප්‍රතිෂ්ඨාපනය කිරීම සැලකිල්ලට ගනිමින්, පහත දැක්වෙන නියම, කොන්දේසි සහ ප්‍රතිඥා අදාළ විය යුතු බවට මම/ අප විසින් එකඟවනු ලැබේ:-

නැව්ගත කිරීමට පෙර හෝ මුහුදෙන් හෝ ගොඩබිමෙන් හෝ ගුවනින් ප්‍රවාහනය කරන අතරතුර හෝ ගමනාන්තයට ළඟා වීමෙන් පසු හෝ රක්ෂණය නොකිරීම හෝ නුසුදුසු ලෙස හෝ ප්‍රමාණවත් නොවන ලෙස රක්ෂණය කිරීම හේතුවෙන් වෙළඳ භාණ්ඩවලට (එකී යෙදුම මෙහි භාවිත කර ඇති කවර වූ හෝ අවස්ථාවක, ඉන් නැව්ගත කරන ලද වෙළඳ භාණ්ඩ ද ලේඛනවල සඳහන් වෙළඳ භාණ්ඩ සහ ලේඛනවලින් නිරූපණය කරන්නේ යැයි කියනු ලබන වෙළඳ භාණ්ඩ ද අදහස් වන අතර එකී භාණ්ඩ ඊට ඇතුළත් වේ) සිදුවිය හැකි යම් අලාභයක් හෝ හානියක් සඳහා හෝ නැව්ගත කරන්නා විසින් හෝ වෙනත් කවර වූ හෝ තැනැත්තකු විසින් නතර කර ගනු ලබන හෝ රඳවා තබා ගනු ලබන වෙළඳ භාණ්ඩවල විස්තරය, ප්‍රමාණය, ගුණාත්මකභාවය, බර, තත්ත්වය, භාරදීම හෝ වටිනාකම සම්බන්ධයෙන් වන යම් අඩුපාඩුවක් සඳහා හෝ එකී භාණ්ඩවල විස්තරය, ප්‍රමාණය, ගුණාත්මකභාවය, බර, තත්ත්වය, භාරදීම හෝ වටිනාකම සම්බන්ධයෙන් වන යම් සාවද්‍ය නියෝජනයක් සඳහා හෝ ඊට අදාළ වන නැව්ගත කරන්නාගේ ගාස්තු සඳහා හෝ නැව්ගත කරන ලද වෙළඳ භාණ්ඩ සහ භාරදෙන ලද ලේඛනවල සඳහන් හෝ එකී ලේඛනවලින් නිරූපණය කරන්නේ යයි කියනු ලබන වෙළඳ භාණ්ඩ අතර ඇති යම් විෂමතාවක් හෝ වෙනසක් සඳහා හෝ භාරදෙන ලද ලේඛනවල වලංගුභාවය, ප්‍රමාණවත්බව, සත්‍යතාව හෝ විධිමත්බව (මා/ අප විසින් එකී කරුණු සියල්ල සඳහා මෙයින් සහතික වනු ලැබේ) සඳහා ඔබ හෝ ඔබගේ ශාඛා, අනුයෝජිතයන් හෝ නියෝජිතයන් වගකීම දැරිය යුතු නොවන බවට සහ ණයවරය යටතේ වන උපදෙස් සහ ණයවරය යටතේ හෝ මේ යටතේ වන උපදේශ සම්ප්‍රේෂණය කිරීම සහ ලේඛන යැවීම සම්පූර්ණයෙන්ම මගේ/ අපගේ අවදානම සහ වියදම යටතේ සිදු කරන බවට මා/ අප විසින් වැඩිදුරටත් එකඟ වන බවට.

මා/ අප විසින් සියලුම භාණ්ඩ ප්‍රවාහන සහ ගොඩබෑම් ගාස්තු නිසි පරිදි ගෙවන බවට ද, එමෙන්ම, ඉහත සඳහන් රක්ෂණාවරණයේ කාලය අවසන්වීමෙන් පසු ගිනි සහ අනෙකුත් සියලු

අවදානම්වලට එරෙහිව ඔබ සහ ඔබගේ ශාඛා, අනුයෝජිතයන් සහ නියෝජිතයන් ආවරණය කරන බවට ද අලාභයක් සිදුවූ අවස්ථාවක රක්ෂණ ඔප්පුව හෝ සහතිකය යටතේ ලැබිය යුතු මුදල අයකරගෙන එම ප්‍රතිෂ්ඨා මුදල් ඔබට ගෙවන බවට ද සහ ගෙවීම කරන තෙක් එම මුදල ඔබ සඳහා සහ ඔබ වෙනුවෙන් භාරකරුවකු ලෙස දරන බවට.

නෞභාරපත්‍ර හෝ එහි ප්‍රතිෂ්ඨා මුදල් හෝ වෙළඳ භාණ්ඩ බැහැර කිරීම සම්බන්ධයෙන් ඔබ සහ ඔබගේ ශාඛා, අනුයෝජිතයන් සහ නියෝජිතයන් විසින් ණයවරය යටතේ ගනුදෙනු කරන ලද යම් අණකරයක් ලියූ තැනැත්තා සහ/ හෝ එහි පිටසන්කරුවන් සමග ඔබ හෝ ඔවුන් විසින් සුදුසු යයි සලකනු ලබන සැලසුම් යොදනු ලැබිය හැකි බවට ද, ණයකර ගනුදෙනු කිරීමේ දී හෝ අන්‍යාකාරයකින් ණයවරය යටතේ හෝ මේ යටතේ ඔබ හෝ ඔබගේ ශාඛා, අනුයෝජිතයන් හෝ නියෝජිතයන් විසින් වැය කරන ලද හෝ ගෙවන ලද යම් මුදල්, පොලී, කොමිස් මුදල් සහ සියලුම ගාස්තු ඔබ වෙත ප්‍රතිපූරණය කිරීමට මා/ අප ප්‍රතිඥා දෙන බවට ද, සියලුම වෙළඳ භාණ්ඩ සහ එහි ප්‍රතිෂ්ඨා මුදල් මත, එකී සියලුම මුදල්, පොලී, කොමිස් මුදල් සහ ගාස්තු ආවරණය කර ගැනීමට ප්‍රමාණවත් මුදලක් සඳහා සියලුම රක්ෂණ ඔප්පු හෝ මුදල් මත සහ ඔබ හෝ ඔබගේ ශාඛා, අනුයෝජිතයන්, නියෝජිතයන් වෙත භාර දෙන ලද සියලුම නෞභාර පත්‍ර මත මෙයින් විශේෂ ගාස්තුවක් හෝ හිලව් කිරීමේ හිමිකමක් ලබා දෙන බවට ද මගෙන්/ අපගෙන් ඉල්ලා සිටීමෙන් හෝ මා/ අප වෙත දැනුම්දීමෙන් තොරව ඕනෑම අවස්ථාවක දී තම අභිමතය පරිදි ඉහත කී දේ ඔබ සඳහා වන ඇපයක් ලෙස හෝ ප්‍රතිපූරණය කිරීම සඳහා රඳවා තබා ගැනීමේ, සන්තකයට ගැනීමේ, විකිණීමේ සහ බැහැර කිරීමේ සහ විකුණුම් කොමිස් මුදල්, නඩු ගාස්තු සහ වෙනත් වියපැහැදම් ඇතුළු සියලුම වියදම් සහ/ හෝ හිඟමුදල් මගෙන්/ අපගෙන් අයකර ඔබගේ ගිණුමට බැර කිරීමේ පූර්ව බලය සහ අධිකාරිය ඔබ සතු බවට ද සහ එය ඉල්ලූ විට ගෙවීමට මා/ අප මෙයින් ප්‍රතිඥා දෙන යම් හිඟ මුදලක් සම්බන්ධයෙන් මට/ අපට එරෙහි තීරණාත්මක සාක්ෂියක් විය යුතු බවට.

අර්ධ වශයෙන් නැව්ගත කිරීම් සම්බන්ධයෙන් වන විට, සත්‍ය වශයෙන් නැව්ගත කළ භාණ්ඩ සඳහා ලබා ගත් අදාළ ප්‍රමාණය නිරූපණය කරන්නා වූ, අර්ධ වශයෙන් නැව්ගත කිරීම් ආවරණය කරන ලේඛන සමග ඉදිරිපත් කර ඇති අණකර සඳහා ඔබ හෝ ඔබගේ ශාඛා, අනුයෝජිතයන්, නියෝජිතයන් විසින් වගකීම දැරිය යුතු නොවන බවට.

නැව් ලේඛන සියල්ල හෝ ඉන් කොටසක් ප්‍රමාදවීම, නැතිවීම හෝ නොපැමිණීම සඳහා ඔබ විසින් වගකීම දැරිය යුතු නොවන බවට.

මෙම ණයවරය මා/ අප විසින් අහෝසි කළ නොහැකි බවට සහ බැංකුවේ ප්‍රකාශිත කැමැත්ත ඇතිව ලිඛිත ආකාරයෙන් මිස වෙනත් කවර වූ හෝ ආකාරයකින් වෙනස් කළ නොහැකි බවට.

ඔබ හෝ ඔබගේ ශාඛා, අනුයෝජිතයන් හෝ නියෝජිතයන් විසින් අණකර ගනුදෙනු කිරීමේ දී හෝ අන්‍යාකාරයකින් ණයවරය යටතේ සැබෑ වශයෙන් වැය කරන ලද හෝ ගෙවන ලද මුදල් ප්‍රමාණ ඉක්මවා ඒ යටතේ යම් වගකීමක් දැරීමට ඔබ හෝ ඔබගේ ශාඛා, අනුයෝජිතයන් හෝ නියෝජිතයන් බැඳී නොසිටින බවට ද ණයවරය යටතේ හෝ සම්බන්ධයෙන් හෝ මේ යටතේ දරන ලද පිරිවැය, ගාස්තු සහ වියදම් යන සියලු වගකීම්වලින් මා/ අප ඔබ සහ ඔබගේ ශාඛා, අනුයෝජිතයන් සහ නියෝජිතයන් හානිපූරණය කරන බවට ද නිදහස් කරන බවට ද සහ කේබල් මාර්ගයෙන් ණයවරය විවෘත කරනු ලැබූ අවස්ථාවක, විදුලි පණිවුඩ/ ටෙලෙක්ස් හෝ ෆැක්ස් පණිවුඩ මගේ/ අපගේ අවදානම සහ වියදම යටතේ යැවිය යුතු යයි සලකනු ලබන බවට ද සහ එම පණිවුඩ සම්ප්‍රේෂණය කිරීමේ දී සිදු විය හැකි යම් දෝෂ හෝ නොකර හැරීම් සඳහා හෝ අදාළ කේබල් හෝ ටෙලිග්‍රාෆ් සමාගම් අතින් සිදු වූ යම් ප්‍රමාදයක් සඳහා ඔබ සහ ඔබගේ ශාඛා, අනුයෝජිතයන් සහ නියෝජිතයන් වගකීම දැරිය යුතු නොවන බවට.

මේ යටතේ හෝ ණයවරය යටතේ ජනිත වූ සියලු බැඳියාවන් දිගටම බලාත්මක විය යුතු බවට ද, ඔබගේ බැංකුව විසින් අන්තර්ග්‍රහණය කිරීම හෝ ඒකාබද්ධ කිරීම මගින් හෝ මගේ/ අපගේ නම, අභිධානය සහ/ හෝ සංයුතිය හෝ ණයවරය ලබාගෙන ඇත්තේ හෝ විවෘත කර ඇත්තේ යම් ව්‍යාපාරයක් සහ/හෝ ගිවිසුමක් හෝ ගිවිසුම් සඳහා ද නැතහොත් සම්බන්ධයෙන් ද නැතහොත් අදාළව ද, එකී මුළු ව්‍යාපාරයේම සහ/හෝ ගිවිසුමේ හෝ ගිවිසුම්වල හෝ එකී කොටසේ අර්ථලාභියාගේ නම, අභිධානය සහ/හෝ සංයුතිය විෂයයෙහි ලා සිදුවන යම් වෙනසක් මගින් ඉහත කී බැඳියාවන් අවසන් නොවන බවට ද නැතහොත් කවර වූ හෝ ආකාරයකින් ඊට අගතියක් නොවන බවට ද, සෑම වැදගත් අංශයෙන්ම, එකී බැඳියාවන් යම් අන්තර්ග්‍රහණය කරන හෝ ඒකාබද්ධ කළ සමාගමක් හෝ වෙළඳ ව්‍යාපාරයක් සඳහා සහ විසින් සහ යම් අනුමිත හෝ මිලදී ගන්නා ව්‍යාපාර ආයතනයක්, සමාගමක් හෝ වෙළඳ ව්‍යාපාරයක් හෝ එකී පැවරීම කර ඇත්තේ යම් ව්‍යාපාර ආයතනයක්, සමාගමක් හෝ වෙළඳ ව්‍යාපාරයක් වෙත ද, එම ව්‍යාපාර ආයතනය, සමාගම හෝ වෙළඳ ව්‍යාපාරය අවස්ථාවෝචිත පරිදි ඉල්ලීම කරන ලද පාර්ශ්වකරුවකු හෝ අර්ථලාභියා වූවාක් මෙන් සහතික කරනු ලැබිය යුතු බවට සහ අදාළ වන බවට.

ඔබ විසින් හෝ ඔබගේ ශාඛා, අනුයෝජිතයන් හෝ නියෝජිතයන් විසින් අණකර ගනුදෙනු කිරීමේ දී හෝ අන්‍යාකාරයකින් ණයවරය යටතේ හෝ මේ යටතේ වැය කරන ලද හෝ ගෙවන ලද සියලු මුදල් ඔබගේ කොමිස් මුදල් සහ ගාස්තු ද සමග මගේ/ අපගේ ගිණුමෙන් හර කිරීමට ඔබට අවසර ඇති බවට.

ණයවරය යටතේ ගනුදෙනු කරනු ලබන අණකර එකී අණකර ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේ දී මා/ අප විසින් යථා පරිදි ප්‍රතිග්‍රහණය කරන බවට සහ කල් පිරෙන අවස්ථාවේ දී එකී අණකර සඳහා ගෙවීම් කරන බවට.

මේ යටතේ බැංකුව සතු අයිතිවාසිකම, ණයවරය යටතේ සහ/ හෝ ඔබේ නමට මා/ අප විසින් දැනටමත් අත්සන් කර ඇති හෝ මින් මතු අත්සන් කරනු ලැබිය හැකි යම් කැපබල ලිපියක් යටතේ වන යම් ගනුදෙනුවක අවස්ථානුගත කරුණු මගින් ජනිත වන්නා වූ, ඔබගේ බැංකුවේ අයිතිවාසිකමට අමතරව විය යුතු බවට සහ එමගින් මේ යටතේ ඔබගේ බැංකුව සතු අයිතිවාසිකමට බලපෑමක් නොවන බවට සහ එය අඩු නොවන බවට.

ඔබ විසින් හෝ ඔබගේ යම් ශාඛාවක් හෝ කාර්යාලයක් හෝ යම් අනුයෝජිතයකු හෝ නියෝජිතයකු හෝ ගනුදෙනු කරන බැංකුව විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක්, කාර්යයක්, කරුණක් හෝ දෙයක්, ඔබට එරෙහිව පටහැනි බවට ප්‍රකාශිතවම ඔප්පු කරනු ලබන්නේ නම් මිස සහ ඔප්පු කරනු ලබන තෙක්, කොටසක් එක් අයකු සමග සහ කොටසක් අනෙක් පාර්ශ්වය සමග, මෙහි නියම සහ කොන්දේසි යටතේ හෝ ඊට අනුකූලව සහ දැනට හෝ ලේඛන ගනුදෙනු කරන අවස්ථාවේ දී, බලපවත්නා ලේඛනමය ණයවර සඳහා වන ඒකීය සිරිත් සහ පිළිවෙත්හි නියම සහ විධිවිධාන යටතේ හෝ ඊට අනුකූලව හෝ ගනුදෙනු කරන ස්ථානයේ හෝ නැව්ගත කරන ස්ථානයේ බලපවත්නා සිරිත් හෝ රීති හෝ පිළිවෙත් හෝ නීති හෝ නියෝග යටතේ හෝ ඊට අනුකූලව කරන ලදැයි හෝ නොකර හරින ලදැයි හෝ නීත්‍යානුකූල ලෙස සහ යථා පරිදි සහ නිසි පරිදි කරන ලදැයි හෝ නොකර හරින ලදැයි සලකනු ලැබිය යුතු බවට ද පූර්ව නිගමනය කළ යුතු බවට ද සහ ලේඛනමය ණයවර සඳහා වන ඒකීය සිරිත් සහ පිළිවෙත්වල පිටපතක් යයි කියනු ලබන්නා වූ ද ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ ප්‍රධානියා හෝ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ වෙනත් යම් නිලධරයකු විසින් සහතික කරන ලදැයි හෝ සැබෑ බවට සහතික කරන ලදැයි කියනු ලබන්නා වූ ද යම් ලේඛනයක නියමවලින් බැඳී සිටීමට මා/ අප එකඟ වන බවට සහ නීතියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එකී පිටපත මට/ අපට එරෙහිව සාක්ෂි ලෙස ආවේශ්‍ය විය යුතු යයි මා/ අප විසින් එකඟ වන බවට.

මගේ/ අපගේ පූර්ව අනුමතය ලබා ගැනීමෙන් තොරව මේ පනතේ වන ස්වකීය අයිතිවාසිකම් සියල්ල හෝ ඉන් කිසිවක් වෙනත් පාර්ශ්වයකට පැවරීමට බැකුවට අයිතිවාසිකම තිබිය යුතු යයි මා/ අප විසින් මෙයින් පිළිගනු ලැබේ.

දිනය :

ඉල්ලුම්කරුගේ නම :

ලිපිනය :

මීට විශ්වාසී,

.....................................

(අත්සන/ අත්සන් සහ සමාගම් මුද්‍රාව)

මේ ලේඛනය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය සහ එහි අනුප්‍රාප්තිකයන් සහ නීත්‍යානුකූල උරුමකරුවන් කෙරෙහි ඇති සියලු බැඳියාවන් .................. මහත්මයන් විසින් යථා පරිදි ඉටු කිරීම සඳහා අප විසින් ප්‍රධානයන් මෙන් මෙයින් සහතික වනු ලැබේ.

බී2 (ණයවර ලිපි ඉල්ලුම්පත්‍රය)